# දැන්වීමයි

# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ඡායාරූප ශිල්පය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

කැලණිය විශ්වවිද්‍යාලයේ, ලලිත කලා අධ්‍යයන අංශයේ, නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා අධ්‍යයන ඒකකය මගින් ආරම්භ කර ඇති ඉහත සඳහන් ඩිප්ලෝමා පාඨමාලාවේ 12 වැනි කණ්ඩායම සඳහා අයදුම්පත් 2023 පෙබරවාරි 28 දක්වා භාරගනු ලැබේ.

**සුදුසුකම්** : අ.පො.ස. (උ/පෙළ) සමත් වීම
**හෝ**
අ.පො.ස (සා/පෙළ) සමත්වීම හා ක්ෂේත්‍රයේ අවුරුදු 05 ක පළපුරුද්ද

**අයදුම් කළ යුතු ආකාරය** :
මහජන බැංකුවේ කැලණිය ශාඛාවේ අංක 055-1-001-1-0667549 දරන කැලණිය විශ්වවිද්‍යාලයීය ගිණුමට බැර වන සේ මහජන බැංකුවේ ඕනෑ ම ශාඛාවකට රු. 1000.00 ක මුදලක් ගෙවා ලබාගත් බැංකු රිසිට්පත සමග නම හා ලිපිනය ලියු රු. 110.00 ක් වටිනා මුද්දර ඇලවූ 9"x4" ප්‍රමාණයේ ලියුම් කවරයක් **ඒකක ප්‍රධාන, නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා අධ්‍යයන ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය** වෙත එවීමෙන් හෝ පැමිණ භාර දීමෙන් අයදුම්පත් ලබා ගත හැකි ය. නැතිනම් අයදුම්පත්‍රය www.kln.ac.lk විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය මගින් ලබාගත හැකි අතර, එසේ අයදුම්පත්‍ර ඉදිරිපත් කරන්නේ නම් ඉහත පරිදි විශ්වවිද්‍යාල ගිණුමට රු. 1000/- ක් ගෙවා ලබාගත් රිසිට්පත අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු වේ. *(අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ 2023 පෙබරවාරි 06 දින සිට 2023 පෙබරවාරි 28 දින දක්වා සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා පමණි.)*

සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග අධ්‍යාපන සහතික, පළපුරුද්ද පිළිබඳ සහතික, උප්පැන්න සහතිකවල සහතික කළ පිටපත් සමග 2023 පෙබරවාරි 28 දිනට පෙර ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු වේ.

අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරි**
කැලණිය විශ්වවිද්‍යාලය
2023 ජනවාරි 23